**මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය - 2023**

-----------------------------------------------------------------------

මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යාන්තර සංවර්ධන සංගමය අතර 2021 අප්‍රේල් 22 දින එළඹි අංක 6623-එල්කේ (සහනදායී ණය) සහ අංක 6624-එල්කේ (සහනදායී නොවන ණය) එස්එෆ් දරන ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය ගිවිසුම අනුව, නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. කෙසේ වෙතත්, 2021 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ වගකීම අමාත්‍ය මණ්ඩල තීරණයක් මත ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත පවරා තිබුණු අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය බවට පත් විය. මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තයේ පොදු ප්‍රවාහන භාවිතා කරන්නන් සඳහා ප්‍රවේශ්‍යතාව, කාර්යක්ෂමතාව සහ ආරක්ෂාව වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වේ. මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය සංවර්ධනය කිරීම, මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය අවට නගර ඒකාබද්ධ කිරීම සහ මාර්ග ආරක්ෂාව වැඩිදියුණු කිරීම, ආයතනික ශක්තිමත් කිරීම සහ ධාරිතා ගොඩනැගීම සහ හදිසි ප්‍රතිචාර සංරචකය යන සංරචක 04 යටතේ ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො. මිලියන 69.33 කට සමාන වූ රු.මිලියන 13,762 ක් වන අතර ඉන් වි.හැ.හි. මිලියන 47.13 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 64.33 ක් සහනදායී කොන්දේසි යටතේ ජාත්‍යාන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යනය කරනු ලබන අතර එ.ජ.ඩො. මිලියන 5 ක් සහනදායී නොවන කොන්දේසි යටතේ ජාත්‍යාන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යනය කරනු ලැබේ. ව්‍යාපෘතියේ කටයුතු 2021 මැයි 06 දින ආරම්භ කරන ලද අතර, 2025 මැයි 31 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගනනය කළ මතය

මාගේ වාර්තාවේ තත්ත්වාගනනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු/ විගණන නිරීක්ෂණය | වටිනාකම රු.මිලියන | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 හි 39 වගන්තියට අනුව, මුදල් හා මුදල් සමාන දෑ වල ආරම්භක සහ අවසන් ශේෂයන් සංසන්දනය කිරීමේදී විදේශ විනිමය හේතුවෙන් සිදුවූ පාඩුව වාර්තා කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ විදේශ විනිමය අනුපාතයේ වෙනස් වීම මත වූ රු. මිලියන 15.47 ක විනිමය අලාභයක් මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා තිබුණි. එම නිසා මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය වැඩියෙන් දක්වා තිබූ අතර අවසාන ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 15.47 | ඉදිරි මූල්‍ය වර්ෂයේ සිට නිවැරදි කිරීමට සටහන් කර ඇත. | ගණකාධිකාරී විසින් රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයේදී සත්මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා පරීක්ෂාකිරීම, සවිස්තරාත්මක සැලසුම් සහ පිරිවැය ඇස්තමේන්තුව සකස් කිරීම සඳහා මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය වෙත ගෙවිය යුතු මුදල රු. මිලියන 2.87 ක් විය. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් කිසිදු වෙන්කිරීමක් සිදුකර නොතිබුණි. | 2.87 | එකඟ වේ. නමුත් මෙය 2023 දෙසැම්බර් 31 දිනට ඉංජිනේරුවරයා විසින් සහතික කර නොතිබුණු බැවින්, එය 2023 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනයේ වගකීමක් ලෙස දක්වා නොමැත. | රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 06 හි 09 වැනි වගන්තිය ප්‍රකාරව සියලුම සිදුවීම් සහ ගනුදෙනු වාර්තා කර තිබේද යන්න මූල්‍ය ප්‍රකාශ අත්සන් කිරීමට පෙර ගණකාධිකාරී සහතික විය යුතුය. |

### 2.2 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| අංකය | නීති,රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ චක්‍රලේඛයේ 2.2.4 උප වගන්තියට අනුව, | පුරප්පාඩු පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනයක් ප්‍රසිද්ධ මාධ්‍යයක ප්‍රචාරය කළ යුතු අතර විනිවිදභාවයෙන් යුතුව සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමට ද කටයුතු කළ යුතුය. එහෙත් එම චක්‍රලේඛයේ විධිවිධාන අනුගමනය කිරීමෙන් තොරව සුදුසු නිලධාරියකු ව්‍යාපෘතියට බඳවාගෙන තිබුණි. | එකඟ නොවෙමි. එය අමාත්‍යාංශයේ සහ මාර්ග සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිවල පළ කර සම්මුඛ පරීක්ෂණ පවත්වා සුදුසු නිලධාරීන් තෝරා ගන්නා ලදී. | ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය සඳහා නව නිලධාරීන් බඳවා ගැනීමට පෙර නව බඳවා ගැනීම් පිළිබඳ දැන්වීම ප්‍රසිද්ධ මාධ්‍යවල පුළුල් ලෙස ප්‍රචාරය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 චක්‍රලේඛය සහ 2009/06/17 දිනැති අංක 09/2009(i) දරන චක්‍රලේඛය අනුව, | ආයතනයේ සියලුම නිලධාරීන් ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් පැමිණීම සහ පිටවීම සහතික කළ යුතු වුවත්, 2024 මැයි 27 දින දක්වා ඇඟිලි සලකුණු යන්ත්‍රයක් සවිකිරීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ.<br>ඇඟිලි සලකුණු යන්ත්‍රයක් සවිකිරීමට කටයුතු කරනු ඇත. | නව ඇඟිලි සලකුණු යන්ත්‍රය වහාම සවිකිරීමට කටයුතු කළ යුතු අතර ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මගින් පැමිණීම තහවුරු කරන තුරු වැටුප් සහ අතිකාල නොගෙවිය යුතුය. |
| (ඇ) | 2018 ජූලි 16 දිනැති අංක 3/2018 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 04 වගන්තියට අනුව, | i. මෙහෙයුම් කල්බදු ක්‍රමයට වාහන ලබා ගැනීම සඳහා රාජ්‍ය ආයතනය මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගත යුතු වුවත්, මහා භාණ්ඩාගාරයේ අනුමැතියක් ලබාගැනීමෙන් තොරව මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ (භාවිතාකර නැවත ලබාදීම) ව්‍යාපෘති කළමණාකරන ඒකකය විසින් වාහන 03 ක් ලබාගෙන තිබුණි. | එකඟ වේ.<br>මෙය ලෝක බැංකු අරමුදල් සපයන ව්‍යාපෘතියක් බැවින් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන මෙහෙයුම් කල්බදු ක්‍රමයට වාහන ලබාගෙන ඇත. ඉහත වාහනවල කල්බදු ගිවිසුම් කාලය දැනටමත් අවසන් වී ඇත. | ජාතික අයවැය චක්‍රලේඛයේ උපදෙස් කඩ කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගත යුතුය. |
| | | ii. චක්‍රලේඛයේ (5) (ඇ) අනුව, ආසන ධාරිතාව 16 නොඉක්මවන වෑන් රථයක සහ ඩබල් කැබ් රථයක මාසික කුලී උපරිම සීමාව පිළිවෙලින් 165,000 ක් සහ 170,000 ක් විය යුතු වුවත, ඉහත සඳහන් චක්‍රලේඛයට පටහැනිව වාහනයක මාසික කුලිය රු.269,000 ක් යටතේ වාහන 03 ක් ව්‍යාපෘතිය වෙත ලබාගෙන තිබුණි. | ඉහත සඳහන් කළ පරිදි | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල විය යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 කොන්ත්‍රාත් පරිපාලනය**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තයේ මූලික කටයුතු සඳහා ව්‍යාපෘති කළමණාකරන ඒකකය වසර 3 ක් ගතකර තිබුණු අතර 2024 මාර්තු 18 දින සිට වසර 3 ක් ඇතුළත මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තයේ ඉදිකිරීම අවසන්කිරීම සඳහා පුද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. 2026 වර්ෂයට පෙර ව්‍යාපෘති | එකඟ වේ.<br>මෙම කොන්ත්‍රාත්තුව පුද්ගලික සමාගමක් වෙත පිරිනමනු ලැබූ අතර එය අවසන් කරන දිනය 2027 මාර්තු 18 දින වේ. මහල් නවයකින් සමන්විත මෙම ගොඩනැගිල්ල සඳහා මුදල් සොයාගැනීමේ අපහසුතා හේතුවෙන් විෂය පථය | එකඟ වූ කාල සීමාව තුළ ව්‍යාපෘතිය නිම කරන ලෙස ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය වෙත උපදෙස් දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කටයුතු සහ මහල් නවයක ගොඩනැගිල්ල නිම කිරීමට නොහැකි වනු ඇති බව නිරීක්ෂණය විය. | සත්මහල් ගොඩනැගිල්ලක් ලෙස වෙනස් කර දැනට දේශීය රාජ්‍ය අංශයේ අරමුදල් වෙන්කරමින් පවතින අතර කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකරමින් පවතී. | |
| (ආ) | ණය ගිවිසුම ක්‍රියාත්මක වන දින සිට මාස හයක් ඇතුලත ව්‍යාපෘතිය විසින් ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතක් සකස් කළ යුතුය. | අදාළ කොන්ත්‍රාත්තුව මෑතකදී ප්‍රදානය කරන ලද අතර ව්‍යාපෘති මෙහෙයුම් අත්පොත සකස් කරමින් පවතී. | ණය ගිවිසුමට අනුව ව්‍යාපෘති මෙහෙයුම් අත්පොත සකස් කරන ලෙස ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් ව්‍යාපෘති කළමණාකරන ඒකකය වෙත උපදෙස් දිය යුතුය. |
| (ඇ) | තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවට අනුව, තෝරාගත් කොන්ත්‍රාත්කරුගේ ව්‍යාපෘති කළමනාකරුගේ සහ ජ්‍යෙෂ්ඨ මගී පර්යන්ත සැලසුම් ඉංජිනේරුවරයාගේ මූලික වෘත්තීය සුදුසුකම්, අවශ්‍ය අවම සුදුසුකම් සපුරා නොතිබුණි. එබැවින් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර එවැනි තනතුරු සඳහා විකල්ප පුද්ගලයින් නම් කිරීමට කමිටුව නිර්දේශ කර තිබුණත්, කොන්ත්‍රාත්කරු විසින් නම් කරනලද පුද්ගලයින් 2024 මැයි අවසන් වන විටත් ව්‍යාපෘතිය විසින් විගණනයට දැනුම් දී නොතිබුණි. | කොන්ත්‍රාත් කොන්දේසි වලට අනුව, කොන්ත්‍රාත් උපදේශක අදාළ තනතුරට සුදුසුකම් සහිත පුද්ගලයකු බඳවා ගැනීමේ කටයුතුවල යෙදී සිටී. | තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවට අනුව කොන්ත්‍රාත්කරු විසින් සුදුසුකම් ලත් නිලධාරීන් යොදවා තිබේද යන්න පිළිබඳව ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් සහතික විය යුතුය. |
| (ඈ) | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා සකස් කරන ලද මෙහෙයුම් අත්පොතට අනුව, ව්‍යාපෘතිය 2026 දී අවසන් කිරීමට සැලසුම් කර තිබුණු අතර 2024 සිට වසර 3 කින් බහුවිධ පර්යන්තය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුමකට ව්‍යාපෘතිය එළඹී තිබුණි. ඉදිකිරීම් ගිවිසුමට අනුව ණය කාලය දීර්ඝ කළ යුතු වුවත්, මෙම වාර්තාවේ දිනය දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමට ණය සැපයුම්කරුගේ එකඟතාවය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | එකඟ නොවෙමි.<br>ණය ගිවිසුම 2029 අගෝස්තු 16 දක්වා දීර්ඝ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇති අතර ඒ අනුව අප විසින් ණය සැපයුම්කරුට දැනුම් දී ඇත. | ණය කාලය දීර්ඝකරවා ගැනීම සඳහා ණය සැපයුම්කරුගෙන් එකඟතාව ලබා ගැනීමට ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලා තිබුණු ව්‍යාපෘති අධීක්ෂණ වාර්තාවක් (Mission report) ණය සැපයුම්කරු වෙත ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ නොවෙමි. අපි විසින් දැනටමත් ලෝක බැංකුවට වියදම් ඇස්තමේන්තුව ඉදිරිපත් කර ඇත. දැනට, දේශීය අරමුදල් වෙන්කිරීම සිදුකෙරෙමින් පවතින අතර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |
| (ඊ) | බහුවිධ පර්යන්තය ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉඩම් සඳහා වන්දි වශයෙන් පුද්ගලයන් 825 දෙනෙකුට රු.මිලියන 712 ක් ගෙවා තිබුණි. එයින් ව්‍යාපාර පාඩු ලෙස රු. මිලියන 35.06 ක් 2019 වසරේ සිට වසර තුනක් සඳහා පුද්ගලයන් 17 දෙනෙකුට ගෙවා තිබුණි. ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් එම පුද්ගලයන්ටම 2022 සහ 2023 වසරවලදී රු.මිලියන 22.2 ක මුදලක් ගෙවීමට ව්‍යාපෘතියට සිදු විය. එපමණක් නොව, මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් කටයුතු අවසන් වන තුරු මෙම ගෙවීම් නැවත නැවත කිරීමට සිදු වේ. | එකඟ වෙමි. | එකඟ වූ කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට ව්‍යාපෘති අධ්‍යක්ෂ කටයුතු කළ යුතුය. |
| (උ) | ව්‍යාපෘතියේ ඉදිකිරීම් ප්‍රමාද වීම හේතුවෙන් ඉදිකිරීම් සඳහා පවරා ගත් ඉඩම පිරිසිදු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2022 සහ 2023 වසරවල පිළිවෙලින් රු.188,000 ක් සහ රු.1,371,934 ක් ගෙවා තිබුණි. ඊට අමතරව සමාලෝචිත වසර අවසානය වන විට රු. 3,000,000 ක මුදලක් ආරක්ෂක කටයුතු සඳහා ගෙවා තිබුණි. | එකඟ වෙමි.<br>අවම ලංසුවට වඩා ලබා ගත හැකි ණය මුදල අඩු වීම නිසා ප්‍රසම්පාදන ක්‍රියාවලියට අපේක්ෂිත කාලය ඉක්මවා දිගු කාලයක් ගත වූ අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමට සිදු විය. | අනාගතයේදී මෙවැනි ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයෙහි අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයීමට හා නව පාලනයක් හඳුන්වා දීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා කටයුතු කළ යුතුය. |

## 3.2 ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ විදේශ ණය සහ දේශීය සංරචකය යටතේ පිළිවෙලින් රු. මිලියන 6,030 ක සහ රු. මිලියන 300 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ විදේශ ණය ප්‍රතිපාදන රු. මිලියන 69.03 ක් සහ දේශීය අරමුදල් රු. මිලියන 128.57 ක් පමණක් උපයෝජනය කර තිබුණි. | එකඟ වෙමි.<br>ලබා ගත හැකි ණය මුදල අවම ලංසුවට වඩා අඩු වීම නිසා ප්‍රසම්පාදන ක්‍රියාවලියට අපේක්ෂිත කාලයට වඩා දිගු කාලයක් ගත වූ අතර අමාත්‍ය මණ්ඩලයේ අනුමත ක්‍රියාවලිය සමඟ ඉදිරියට යාමට සිදු විය. | වැඩ සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්මට අනුගතව කටයුතු කළ යුතුය. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ගැටළු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| ව්‍යාපෘති කටයුතු ප්‍රමාද වී තිබුණද, අතිරික්ත ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවකු ව්‍යාපෘතිය සඳහා බඳවාගෙන තිබුණි. | එකඟ වෙමි.<br>ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා, ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන මා.සං.අ. වෙතින් අදාළ ප්‍රධාන කාර්ය මණ්ඩලය පත් කරන ලදී. ඉලක්කගත දිනය තුළ ව්‍යාපෘතිය නිම කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවරයාගේ සේවය අත්‍යවශ්‍ය බැවින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට දැනටමත් ඉල්ලීමක් කර ඇත. | සියලුම බඳවා ගැනීම් ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයේ අනුමත සේවක සංඛ්‍යාව තුල සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා සහතික විය යුතුය. |

### 3.4 ව්‍යාපෘති අරමුණුවලින් බාහිර ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවලට අනුව මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවීමට ඉතිරිව තිබූ රු.185,954 ක මුදලක් වගකීමක් ලෙස පෙන්වා දී තිබුණු අතර, ව්‍යාපෘතියෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස රු. 1,634,458 ක් සමාලෝචිත වර්ෂය අවසානයේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සටහන් කර තිබුණි. එබැවින් රු. 1,448,504 ක වෙනස සඳහා හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරියේ ගිණුම් සමඟ සංසන්දනය කර යම් ගැලපීමක් ඇති වුවහොත් 2024 වර්ෂයේ අවසාන ගිණුම් වලදී නිවැරදි කරනු ලැබේ. | ගණකාධිකාරී විසින් මූල්‍ය ප්‍රකාශය අත්සන් කිරීමට පෙර ශේෂයන්ගේ වෙනස්කම් සත්‍යාපනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.5 පද්ධති හා පාලන

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ව්‍යාපෘතිය සඳහා වාහන 09 ක් භාවිත කර ඇති අතර, ඉන් වාහන 05 ක් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලැබුණු අතර, වාහන 03 ක් කුලී පදනම මත ලබාගෙන තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් ලැබුණු වාහන 02 ක් භාවිත කර නොතිබුණු අතර, කුලියට ගත් වාහන කි.මී. 2500 ක මාසික සීමාවන් ඉක්මවා භාවිතා කර අමතර ගාස්තු ලෙස රු. 447,195 ක් ගෙවා තිබුණි. | එකඟ නොවෙමි.<br>ව්‍යාපෘතිය වාහන 08 ක් පමණක් භාවිත කර තිබුණු අතර අලුත්වැඩියා කටයුතු හේතුවෙන් වාහන 01 ක් භාවිත කර නොතිබුණි. | අයවැය චක්‍රලේඛය 01/2024 අනුව වාහන නඩත්තු පිරිවැය පාලනය කිරීමට ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ව්‍යාපෘතියේ වාහන නඩත්තු පිරිවැය 2022 සහ 2023 වර්ෂයන්හි පිළිවෙලින් රු. මිලියන 2.64 සහ රු.මිලියන 21.11 ලෙස සටහන් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ වියදම රු.මිලියන 18.47 කින් වැඩි වී තිබුණි. ඒ අනුව, ව්‍යාපෘතිය වාහන නඩත්තු වියදම් පාලනය කිරීමට කටයුතු කර නොතිබුණි. | අනෙකුත් ව්‍යාපෘති මගින් භාවිත කරන ලද විධිමත් නඩත්තුවක් අවශ්‍ය වාහන පහක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මෙම ව්‍යාපෘතියට ලබාදී ඇත. එම නිසා එම වාහනවල නඩත්තු වියදම වැඩිවී ඇත. | වාහන නඩත්තු පිරිවැය පාලනය කිරීමට අයවැය චක්‍රලේඛය 01/2024 අනුව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා කටයුතු කළ යුතුය. |